

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT

2019

ලෝහෝර් ආර්යා ණය අරමුදල - මුදල් අමාත්‍යාංශය

லோஹோர் சீமாட்டிக் கடன் நிதியம் - நிதி அமைச்சு

Lady Lochore Loan Fund - Ministry of Finance

පටුන

සංස්ථාපිත තොරතුරු		**01**
සභාපතිතුමාගේ පණිවුඩය		**02**
පාලන භාරකාරතුමියගේ පණිවුඩය		**03**
1.	**අරමුදලේ පසුබිම**	**04**
1.1	භාරකාර මණ්ඩලය	**04**
•	2019 වසරේ අරමුදලේ කාර්යය මණ්ඩලය	
1.2	සංවිධාන ව්‍යුහය	**05**
2.	**2019 වසරේ අරමුදලෙහි කාර්යසාධනය**	
2.1	2019 වසරේ ප්‍රතිලාභීන්	**06-08**
2.2	ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රගතිය	**09-10**
2.3	නිකුත් කල ණය සීමාවන් හා ණය මුදල් වටිනාකම	**10**
2.4	ණය අයකර ගැනීමේ ප්‍රගතිය	**10**
2.5	කාර්යාල සංකීර්ණය - ලෝහෝර් ආර්යා ණය අරමුදල	**11**
2.5.1	කුලී ආදායම	**11**
2.5.2	අරමුදලෙහි තිරසාරභාවය	**12**
2.5.3	මෙහෙයුම් ආදායම	**12**
3.	**සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය**	
3.1	දැනුම හා පුහුණු ධාරිතාවය ඉහළ නැංවීම සඳහා කාර්ය මණ්ඩල පුහුණුව-2019	**13-16**
3.2	අරමුදලේ බඳවා ගැනීමේ සහ උසස්වීම් පරිපාටින්	**17**
•	උසස් වීම හා නව බඳවා ගැනීම්	
3.3	අරමුදල් පරිශ්‍රය නවීකරණය කිරීම	**17**
3.4	කාර්යාලීය ක්‍රමවේදයන් විධිමත් කිරීම	**17**
3.5	කාර්ය මණ්ඩල ණය	**18**
3.6	ඉඩම් ඔප්පු සහ බැදුම්කර	**18**
3.7	රැස්වීම්	**18**
3.8	විගණන හා කළමණාකරණ කමිටුව	**18**
4.	**අනාගත සැලසුම්**	**19**
5.	**ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව**	**20**
6.	**ආදායම් ප්‍රකාශනය**	**21**
7.	**මූල්‍ය තත්ව ප්‍රකාශනය**	**22**
8.	**ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශය**	**23**
9.	**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**	**24**
10.	**ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති**	
•	පොදු	**25**
•	වත්කම් හා එහි වටිනාකම් තක්සේරු කිරීමේ පදනම	**25-26**
•	වගකීම් හා ප්‍රතිපාදන	**26**
•	ආදායම් ප්‍රකාශනය	**27**
11.	**මූල්‍ය ප්‍රකාශනයන්ට අදාල සටහන්**	**28-33**

ලෝහෝර් ආර්යා ණය අරමුදල

දැක්ම

රාජ්‍ය හා රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවකයින් සහ
ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා මූල්‍ය පහසුකම්
සලසා දෙනු ලබනප්‍රමුඛ ආයතනයක් ලෙස ක්‍රියා කිරීම.

මෙහෙවර

රාජ්‍ය හා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවකයින් සහ
ත්‍රිවිධ හමුදා සාමාජිකයින් ණය බරින් මුදවා යහපත් මානසික පරිසරයකින් යුත්
රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම සඳහා දායකවීම.

අරමුණ

රාජ්‍ය හා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවකයින් හා
ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා සහනශීලි පොලී අනුපාතයක් හා පහසු කොන්දේසි මත
කෙටි කාලීන ණය මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීම මඟින්
ඔවුන්ව ණය බරින් මුදවා ගැනීම.

කාර්ය භාරය

- ණය අරමුදල කිරසාරව පවත්වා ගනිමින් සේවා ලාභීන් සඳහා ණය පහසුකම් සැපයීම
- ආයතනික ප්‍රවර්ධනය සහ එයට සාපේක්ෂව ධාරිතාවය වැඩි කිරීම
- අරමුදල් සම්පාදනය කර ගනිමින් ආයතනය පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියා පටිපාටින් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- ණය කළමනාකරණය සඳහා යෝග්‍ය වන ක්‍රමෝපායන් දියුණු කිරීම සහ ණය දීමේ පහසුකම් කාර්යක්ෂමව කිරීම සහ වැඩි දියුණු කිරීම
- අනිකුත් රාජ්‍ය ආයතන වල සේවකයින් සඳහා වූ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ දී පහසු කාරකයෙකු වශයෙන් කටයුතු කිරීම
- ණය ලබා දීමේ දී හා කටයුතු පවත්වාගෙන යාමේදී විධිමත් මූල්‍ය පාලන ක්‍රමවේදයක් ඇතිව කටයුතු කිරීම.

සංස්ථාපිත තොරතුරු

ආයතනයේ නම ලිපිනය :

- **ලෝහෝර් ආර්යා ණය අරමුදල**
- 100/ 3/2, ශ්‍රීමත් විත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

සංස්ථාපිත කිරීම :

- 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල භාරකාර මණ්ඩල පනත (1953 සංශෝධිත) යටතේ ස්ථාපිත මුදල් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත ආයතනයකි.

භාරකාර මණ්ඩලය :

➢ ඒ. පී. කුරුම්බලපිටිය මහතා	- සභාපති (අධ්‍යක්ෂ - රාජ්‍ය ගිණුම් දෙපාර්තුමේන්තුව), මුදල් අමාත්‍යාංශය
➢ එස්.වින්ස්ටන් පතිරාජ මහතා	- පාලන භාරකාර, ලෝහෝර් ආර්යා ණය අරමුදල
➢ පී.එච්.එල්. පෙරේරා මහතා	- භාරකාර
➢ එච්.සී.පී.විතානගේ මහතා	- භාරකාර
➢ ඒ.එච්.පේමදාස මහතා	- භාරකාර

විගණන කමිටුව :

➢ ජේ.ජයසුන්දර මහතා	- සභාපති, (අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව)
➢ පී.එච්.එල්. පෙරේරා මහතා	- සාමාජික (භාරකාර, ලෝහෝර් ආර්යා ණය අරමුදල)
➢ ඒ.එච්.පේමදාස මහතා	- සාමාජික (භාරකාර, ලෝහෝර් ආර්යා ණය අරමුදල)

විගණක: රන්වත්ත සහ සමාගම,
වරලත් ගණකාධිකාරී,
141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

නිල බැංකුකරු: මහජන බැංකුව,
මූලස්ථාන ශාඛාව,
කොළඹ 02.

සභාපතිතුමාගේ පණිවුඩය

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා සපුරාගැනීම මූලිකව අරමුණු කරගෙන 1927 මාර්තු මස 26 දින ආරම්භ කරන ලද ලෝහෝර් ආර්යා ණය අරමුදල 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනත මගින් ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පරිවර්ථනය කරන ලදී.

වර්තමාන සංකීර්ණ සමාජය තුළ රජයේ සේවකයන් මුහුණපාන විවිධ ආර්ථික දුෂ්කරතා හේතුවෙන් කෙටිකාලීන ණය අවශ්‍යතාවයන්ගෙන් ඔබ්බට ගොස් විවිධ දිගුකාලීන ණය අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා ද ණය ඉල්ලුම් කිරීම සඳහා පෙළඹී ඇත. එබැවින් වර්තමාන අවශ්‍යතාවයන්ට සරිලන පරිදි අරමුදලේ කාර්යයන් පළල් වූ ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ප්‍රසාරණය කර ඇත .

මෙහිදී ප්‍රධාන වශයෙන් මාණ්ඩලික නිලධාරීන් සඳහා වෙනම ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. අරමුදලේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වය පරීක්ෂා කර වර්තමාන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි වඩාත් සරල හා ඵලදායී වැඩ පියවරයන් හඳුන්වා දී ඇති අතර එමගින් අඩු කාලයක් හා පිරිවැයක් යටතේ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මක කිරීමට හැකිවිය .

විශේෂයෙන් මෙහිදී අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීම, ණය අනුමත කිරීමේ ක්‍රියාදාමය තුළ ඇති ණය පරීක්ෂා කිරීම, අනුමත කිරීම හා ගෙවීමට අදාළ ක්‍රියාපටිපාටියන් ස්වාධීනව පරීක්ෂා වන පරිදි පරීක්ෂා කිරීම හා සැකසීම් ක්‍රමවේදයන් හඳුන්වාදෙන ලදී. එමෙන්ම ණය ගෙවීමේදී එක් එක් ණයකරුවන් වෙන වෙනම චෙක්පත් ලිවීම වෙනුවට සෘජුව ඔවුන්ගේ බැංකු ගිණුම් වෙත බැර කිරීමේ ක්‍රමවේදයන් හඳුන්වාදීම හේතුවෙන් දුරබැහැර ප්‍රදේශවල ණය ඉල්ලුම්කරුවන් හට ඔවුන්ගේ කාලය හා පිරිවැය ඉතිරි කර ගැනීමට හේතු වූ අතර නව තාක්ෂණ ක්‍රමවේද යොදාගැනීම අරමුදලේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ද හේතු විය .

ඊට අමතරව අරමුදලේ භෞතික වත්කම් වැඩිදියුණු කිරීම යටතේ පැරණි ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් අලුත්වැඩියා කර 2019 වර්ෂය තුල නිම කිරීමට හැකිවීම මෙම අරමුදල ලැබූ ජයග්‍රහණයකි .

2019වර්ෂයේ අරමුදලේ මූල්‍ය කාර්යසාධනය හා මූල්‍ය තත්ත්වය විමර්ෂණය කිරීමේදී පෙර වර්ෂය හා සැසඳීමේදී මුලු ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 09 කින් වැඩිවී ඇති අතර ඊට සාපේක්ෂව මෙහෙයුම් වියදම වැඩිවී ඇත්තේ රුපියල් මිලියන 01 කින් පමණි. ඒ අනුව මෙහෙයුම් ආදායමට සාපේක්ෂව මෙහෙයුම් වියදමේ ප්‍රතිශතය පෙර වර්ෂය හා සැසඳීමේදී 50% සිට 48% දක්වා අඩු වී ඇත. ඒ සඳහා විශේෂයෙන් පරිපාලන ක්‍රියාවලිය තුල සිදුකරන ලද ව්‍යුහාත්මක වෙනස්කම් ප්‍රධාන වශයෙන් බලපාන ලදී. එමෙන්ම, බදු වලට පසු ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 06 කින් පමණ වැඩිවී ඇති අතර එය මෙහෙයුම් ආදායම හා සැසඳිමේදී පෙර වර්ෂයට සාපේක්ෂව 2% ක පමණ වැඩිවීමකි.

අරමුදලේ මූල්‍ය තත්ත්වය පරීක්ෂා කිරීමේදී අරමුදලේ ශුද්ධ වත්කම රුපියල් මිලියන 42 කින් පමණ වැඩිවී ඇති අතර මුල්‍ය වත්කම්ද රුපියල් මිලියන 49 කින් පමණ වැඩිවී ඇත .

ඒ අනුව, 2019 වර්ෂයේ කාර්යසාධනය අත්පත් කර ගැනීමේදී සේවක මණ්ඩලය දැක්වූ දායකත්වය පිලිබඳව මාගේ ප්‍රණාමය ඔවුන්ට හිමිවන අතර ඔවුන්ගේ සෘජු දායකත්වය නොතිබෙන්නට මෙම කාර්යසාධනය ළඟා කර ගැනීම දුෂ්කර ඉලක්කයක් විය හැකිව තිබුණි. විශේෂයෙන් අරමුදලේ ප්‍රගමනය සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී පාලන භාරකාර මණ්ඩලයේ සියලුම සාමාජිකයන් විසින් දැක්වූ ඔවුන්ගේ ව්‍යක්තීය නිපුණත්වය අරමුදලේ ඉදිරි පැවැත්ම සඳහා මහඟු පිටුවහලක් විය.

ඒ අනුව 2020 වර්ෂයේදී නව තාක්ෂණය භාවිතා කරමින් අරමුදලේ කාර්යයන් වඩාත් සරල හා කාර්යක්ෂම ක්‍රමවේදයකට පරිවර්තනය කර අවම පිරිවැයක් යටතේ ඉහළ ඵලදායිතාවයක් ලබා ගැනීමට කැපවෙන බවට සහතික වෙමි.

ඒ.පී. කුරුම්බලපිටිය
සභාපති
ලෝහෝර් ආර්යා ණය අරමුදල.

පාලන භාරකාරතුමිගේ පණිවුඩය

වසර 92 කට පෙර ජීන් ලෝහෝර් ආර්යාව විසින් පිහිටුවන ලද මෙම අරමුදල එවක පටන් මේ දක්වා මාසික වැටුප් ලබන්නන්ගේ ගෞරවය හා අභිමානය රැක දීමට ඉවහල් විය. එවකට ණය බරින් පීඩිතව ඉතා දුෂ්කර තත්වයකට පත්ව සිටි රාජ්‍ය / පෞද්ගලික අංශවල සේවකයන්ගේ ගැටළු හඳුනාගත් එතුමිය තම කාරුණික හා මානුෂීය ගුණාංගයන් ශ්‍රී ලාංකීය වැඩකරන ජනතාව වෙත යොමු කරමින් මෙකී සත්කාරය ආරම්භ කළාය.

මෙම වර්ෂයේදී විවිධ තරාතිරම්වල රාජ්‍ය සේවකයන් 3870 දෙනෙකු වෙත රුපියල් මිලියන 466.2 ක් වූ ණය පහසුකමක් අරමුදල ලබා දීමට සමත් වී තිබීම මත අරමුදලේ නිර්මාතෘතුමියගේ අරමුණු වඩා ශක්තිමත් ලෙස සඵල කිරීමට සමත් වී ඇති බව සතුටට කරුණකි. පෙර වසරට සාපේක්ෂව 32% ක වර්ධනයක් ණය නිකුත් කිරීමේහිලා අත්පත් කර ගැනීමට හැකි වී තිබීම විශේෂත්වයකි.

රුපියල් මිලියන 474 ක් අවකරණ වශයෙන් ගත වූ වර්ෂයක කාලය තුල අයකර ගෙන ඇති අතර මෙයද පෙර වර්ෂයට සාපේක්ෂව 15.3% ක වර්ධනයකි.

රුපියල් මිලියන 111.6 ක් වූ මුළු ආදායමක් මෙම වසර තුල ඉපයීමටද අරමුදල සමත් වී ඇති අතර මින් රුපියල් මිලියන 53.5 ක මෙහෙයුම් වියදමක් දැරීමෙන් අනතුරුව රුපියල් මිලියන 15.9 ක බදු මුදලක් රජයට උපයා දීමෙන්ද රුපියල් මිලියන 42.1 ක් වූ බදු පසු ශුද්ධ ලාභයක් ඉපයීමට සමත් වී ඇත. පසුගිය වර්ෂයට සාපේක්ෂව 10.5% ක වර්ධනයකින් මෙම වර්ෂයේ බදු පසු ශුද්ධ ලාභය වර්ධනය වීම අප ආයතනය ලැබූ සුවිශේෂි ජයග්‍රහයනකි.

අරමුදලේ සාර්ථකත්වයට හා සියළු කර්තව්‍යයන් සඳහා මගපෙන්වන මුදල් අමාත්‍යාංශයත් කාර්ය සාධන ප්‍රතිපත්තීන් මෙහෙයවන භාරකාර මණ්ඩලයත් ඇප කැප වී නොපිරිහෙලා තම කාර්යභාරය ඉටුකරන අරමුදලේ කාර්ය මණ්ඩලයත් මෙම ලැබූ සාර්ථකත්වයේ නියමුවන් සේ හැඳින්විය හැක.

අනාගතයේදී මෙම සේවාව ජාතික වශයෙන් පුළුල් කර විවිධ ක්ෂේත්‍රයන් සඳහා ණය අවශ්‍යතා සපුරන ජනතා හිතවාදී වඩාත් කාර්යක්ෂමව ආයතනයක් බවට පත් කිරීමට අප සියළු දෙනා අරමුණු කරගෙන සිටිමු.

ලෝහෝර් ආර්යා ණය අරමුදල ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙලේ මුල්‍ය ආයතනයක් බවට පත්කර දීමටත් අරමුදලේ දැක්ම මෙහෙවර අනුව යමින් අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට භාරකාර මණ්ඩලයට හා කාර්ය මණ්ඩලයට ශක්තිය ධෛර්ය හා වාසනාව ලැබේ යැයි ප්‍රාර්ථනා කරමි.



කමලා රණතුංග
පාලන භාරකාර
ලෝහෝර් ආර්යා ණය අරමුදල

01

අරමුදලේ පසුබිම

ශ්‍රී ලංකාවේ කලක් වාසය කල ස්කොට්ලන්ත ජාතික ජීන් ලෝහෝර් ආර්යාව විසින් ණය අරමුදලක් පිහිටුවීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය සඳහා පවුම් 300 ක මුදලක් පරිත්‍යාග කර තිබිණි. එවකට පුණ්‍ය කොමසාරිස්ව සිටි සී.ඊ්.වී.නැතනියල්ස් පියතුමා අරමුදල පිහිටුවීමේ කාර්යයෙහි මූලිකව කටයුතු කර ඇති අතර එය 1927 මාර්තු 26 වන දින ලෝහෝර් ආර්යා ණය අරමුදල නමින් ආරම්භ කරන ලදී. එමෙන්ම අරමුදල 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනත මගින් ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත් විය.

එදා සිට මෙම අරමුදල ප්‍රතිලාභීන් වෙත ණය ප්‍රදානය කරමින් සහ එම ණය ආපසු අයකර ගනිමින් චක්‍රිය අරමුදලක් ලෙසින් ක්‍රියාත්මක වෙමින් පවතී. රාජ්‍ය අංශයේ මෙන්ම වෙළඳ සමාගම්වල සේවය කරන සේවකයින්ටද තමන්ගේ කෙටි කාලීන මුදල් අවශ්‍යතා සපුරා ගැනීමට එවකට පැවති බැංකු ක්‍රමයෙන් පිටිවහලක් නොලැබුන හෙයින් ඔවුන් අධික පොළියට ණය සපයන පුද්ගලයන්ගෙන් ණය ලබා ගැනීමට පුරුදු වී සිටියහ. මේ පසුබිම තුල රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවකයින්ද ණය බරින් පීඩනයට පත්විය. මෙවැනි පරිසරයක් තුල ලෝහෝර් ආර්යා ණය අරමුදල පිහිටුවීමෙන් පසු මෙම සේවකයින්ට ණය ලබා ගැනිමේදි ඉමහත් සහනයක් සැලසුනි. 1951 මෙම පනත ව්‍යවස්ථාගත වීමත් සමගම අරමුදලට රජයෙන් මෙන්ම වෙනත් පරිත්‍යාගශීලීන්ගෙන් ද ලැබුන ආධාර උපයෝගි කරගෙන මෙම ආයතනයටම අයත් තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ඇත.



ජීන් ලෝහෝර් ආර්යාව



1.1. භාරකාර මණ්ඩලය

භාරකාර මණ්ඩලය ගරු මුදල් ඇමතිතුමා විසින් පත් කරනු ලබන රාජ්‍ය අංශයේ සහ සුදුසුකම්ලත් පෞද්ගලික අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විත වේ. මෙම ආයතනයෙහි අනුශාසක ධුරය මුදල් අමාත්‍යතුමා විසින් හොබවනු ලබයි. අරමුදලෙහි පරිපාලන කටයුතු සඳහා පාලන භාරකරුවකු ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනතේ 10 වන හා 11 වන වගන්ති ප්‍රකාරව භාරකාර මණ්ඩලය සඳහා පත් වූ අය අතරින් කෙනෙකු පත්කරනු ලැබේ. එම පනතෙහි 5 වන වගන්තියට අනුව භාරකාර මණ්ඩලයෙහි සභාපති තනතුර භාණ්ඩාගාර නියෝජිතවරයා වෙත පවරා ඇත.

වගුව 01 – 2019 වසරේ අරමුදලේ කාර්යය මණ්ඩලය

අනුමත තනතුර	අනුමත තනතුරු සංඛ්‍යාව	සේවයේ නියුතු සංඛ්‍යාව
ගණකාධිකාරි	01	01
පරිපාලන නිලධාරි	01	01
ගිණුම් නිලධාරි	01	01
අභ්‍යන්තර විගණක නිලධාරි	01	01
ණය අයකර ගැනීමේ නිලධාරි	01	01
තොරතුරු තාක්ෂණ නිලධාරි	01	01
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන ශ්‍රේණිය)(ලේඛනාගාර සහකාර ඇතුළු)	34 } 35	29
ගොඩනැගිලි අධීක්ෂක (කළමනාකරණ සහකාර - තාක්ෂණික ශ්‍රේණිය)	01 }	-
කාර්යාල කාර්ය සහායක (ප්‍රාථමික ශිල්පීය නොවන)(නිල බංගලා භාරකරු ඇතුළුව)	07	06
ගොඩනැගිලි නඩත්තු සහායක (ප්‍රාථමික අර්ධ ශිල්පීය)	01	01
රියදුරු (ප්‍රාථමික ශිල්පීය)	02	02
එකතුව	51	44

1.2 සංවිධාන ව්‍යූහය



2019 වසරේ අරමුදලෙහි කාර්යසාධනය

2.1 2019 වසරේ ප්‍රතිලාභීන්

2019 වසරේදී රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු සේවකයින් 3870 ක් මෙම අරමුදලේ ප්‍රතිලාභීන් වී ඇත. එම ප්‍රතිලාභීන් පදිංචි දිස්ත්‍රික්කය අනුව දෙවන වගුවෙහි වර්ගීකරණය කර ඇති අතර 2019 වර්ෂයේදී පෙර වසරට සාපේක්ෂව ණය ප්‍රමාණයේ 6.43% ක වැඩි වීමක් මෙන්ම ණය මුදල් ප්‍රමාණයේ පෙර වසරට සාපේක්ෂව 31.73% ක වැඩි වීමක් දක්නට ඇත. ප්‍රතිලාභීන්ගෙන් 75% අධික පිරිසක් ආරක්ෂක අංශයේ නියුතු පුද්ගලයින් වන බව පහත වගුවෙන් නිරූපනය වේ.

වගුව 02 – **2018/2019** වර්ෂවල ණයලබා ගත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක අනුව

ප්‍රතිලාභීන් සංඛ්‍යාව				
දිස්ත්‍රික්කය	2019	(%)	2018	(%)
කොළඹ	617	15.94	577	15.87
ගම්පහ	603	15.58	567	15.59
අනුරාධපුරය	182	4.70	241	6.63
මහනුවර	236	6.10	201	5.53
වව්නියාව	6	0.16	3	0.08
කළුතර	349	9.02	351	9.65
රත්නපුර	153	3.95	140	3.85
ගාල්ල	239	6.18	211	5.80
කුරුණෑගල	410	10.59	363	9.98
පුත්තලම	53	1.37	55	1.51
යාපනය	0	-	0	-
පොළොන්නරුව	87	2.25	73	2.01
ත්‍රිකුණාමලය	13	0.34	21	0.58
මුලතිව්	0	-	0	-
බදුල්ල	134	3.46	128	3.52
මාතලේ	98	2.53	96	2.64
හම්බන්තොට	85	2.20	73	2.01
කෑගල්ල	239	6.18	210	5.78
මඩකලපුව	0	-	3	0.08
අම්පාර	77	1.99	67	1.84
මොනරාගල	98	2.53	100	2.75
නුවරඑළිය	57	1.47	51	1.40
මන්නාරම	0	-	1	0.03
මාතර	134	3.46	104	2.86
එකතුව	**3870**	**100**	**3636**	**100**

ප්‍රස්තාරය 01 - **2018 / 2019** වර්ෂවල ණය ලබාගත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක අනුව.



වගුව 03 - **2018** හා **2019** වර්ෂවල රාජ්‍ය සේවා ප්‍රතිලාභීන් තනතුරු අනුව

තනතුර	2019	2018
කෝප්‍රල්	1016	907
හමුදා සෙබල	328	411
හමුදා සැරයන්	146	103
මේජර්	48	25
ලුතිනන්	31	9
බ්‍රිගේඩියර්	2	-
අරක්කැමි	20	17
භෝජනාගාර සේවක	18	19
පොලිස් කොස්තාපල්	826	813
පොලිස් සැරයන්	283	211
පොලිස් පරීක්ෂක	46	39
ප්‍රධාන පොලිස් පරීක්ෂක	9	-
උප පොලිස් පරීක්ෂක	60	47
පොලිස් ආරක්ෂක සහායක	2	20
පොලිස් සිවිල් සහායක	6	0
ගිනිහටයන්	10	20
රියදුරු	86	90
රිය සහායක	5	-
බන්ධනාගාර නියාමක	25	19

මැනුම් සහායක	14	24
සෞඛ්‍ය පරිපාලක	-	0
උපස්ථායක	4	1
සාමාන්‍ය කම්කරු	206	226
කාර්යාල කාර්යය සහායක	187	238
කළමනාකරණ සහකාර	184	156
සංවර්ධන සහකාර	56	32
ආයුර්වේද වෛද්‍ය සහායක	1	-
ඖෂධවේදී	4	-
මූරකරු	6	5
ආරක්ෂක නියාමක	3	-
මෝටර් කාර්මික	6	2
කාර්මික ශිල්පි	1	4
වඩු කාර්මික නිලධාරී	2	4
මානව සම්පත් සහකාර	1	0
පරිපාලන නිලධාරී	1	1
පෙදරේරු	2	1
ගණකාධිකාරී	6	7
ගබඩා සහායක	1	1
විදුලි කාර්මික	3	0
ඔවර්සියර්	3	0
තැපැල් නිලධාරී	-	3
සහකාර අධ්‍යක්ෂක	10	0
සහකාර ලේඛම්	2	-
පුනරුත්ථාපන නිලධාරී	1	-
සිතාසිකරු	1	-
වනජීවී ආරක්ෂක නිලධාරී	1	-
කාලගුණ විද්‍යා නිලධාරී	1	-
පිළිගැනීමේ නිලධාරී	-	0
පොත් බැඳුම්කරු	4	0
ග්‍රාම නිලධාරී	3	0
වැඩසටහන් සහකාර	3	0
කොමිෂන් නොලත් නිලධාරි	46	11
ගිණුම් නිලධාරී	2	-
බලලත් නිලධාරි	-	7
මැනුම් ක්ෂේත්‍ර සහායක	3	11
රසායනාගාර සහායක	2	2
කර්මාන්ත පරිපාලක	1	-
හෙද නිලධාරී	3	7
කපිතාන්	52	44
අස්ගොව්	8	2
අත් උදව්කරු	1	-
විදුලි පහන් දල්වන්නා	-	2
යන්ත්‍ර ක්‍රියාකරු	-	2
කෘෂිකර්ම උපදේෂක	2	-
පින්තාරුකරු	2	-
තාක්ෂණ නිලධාරී	4	6
තැපැල්කරු	5	5
තැපැල් නිලධාරී	1	-
පරිවර්තක	-	0
රෙජිස්තාර්	2	-
කර්නල්	1	4
පෙර පාසල් ගුරු	5	0
කොමසාරිස්	3	-
පුස්තකාලාධිපති	1	2
පුස්තකාල සහායක	1	1
අධ්‍යක්ෂක	-	6
කැමරා ශිල්පි	-	69
වෙනත්	41	0
එකතුව	**3870**	**3636**

2.2 2019 ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රගතිය

පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයෙකුට මෙම අරමුදලෙන් ණය අයදුම් කළ හැක.

- විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු වසර 3 ක අවම ස්ථිර සේවා කාලයක් හිමි රාජ්‍ය සේවකයකු වීම.
- අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් වසර 5 ක අවම ස්ථිර සේවා කාලයක් සපුරා තිබීම.
- ලබා දෙනු ලබන ණය මුදල් සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට තරම් ප්‍රමාණවත් සේවා කාලයක් තිබීම. (විශ්‍රාම ගන්නා වයස් සීමාව අවුරුදු 59 ලෙස සලකයි)
- අයදුම්කරු සඳහා ඉහත සුදුසුකම් සහිත ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කිරීම.
- අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් ඇපකරුවන් දෙදෙනාගෙන් එක් අයකු අවම වශයෙන් වසර 03 ක ස්ථිර සේවා කාලයක් පවතින විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු අයකු වීම.
- සියළුම ණය අයදුම්කරුවන්ගේ මාසික වේතනයෙන් 40% සීමාව තුල ණය වාරිකය අයකර ගැනීමේ හැකියාව තිබීම.

වගුව 04 - සුදුසුකම්ලාභීන්ගෙන් ඉදිරිපත් වූ අයදුම්පත්‍ර හා ණය නිකුත් කිරීම පිලිබඳව 2019 වසරේ ප්‍රගතිය පහත වගුවෙන් පැහැදිලි වේ.

මාසය	ණය අයදුම් කළ සංඛ්‍යාව	නිකුත් කල ණය සංඛ්‍යාව	ණය වටිනාකම (රු. 000)
ජනවාරි	**388**	358	44,515
පෙබරවාරි	463	358	45,095
මාර්තු	529	444	57,745
අප්‍රේල්	249	364	40,300
මැයි	270	301	35,275
ජූනි	338	252	33,935
ජූලි	379	367	44,355
අගෝස්තු	350	249	28,975
සැප්තැම්බර්	291	266	30,015
ඔක්තෝබර්	339	306	35,490
නොවැම්බර්	245	317	39,450
දෙසැම්බර්	214	288	31,070
එකතුව	**4055**	**3870**	**466,220**

ප්‍රස්තාරය 02 - ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය - **2019**



2019 වසරේදී ණය අයදුම් කළ සංඛ්‍යාව 4055 වුවද නිකුත් කළ ණය සංඛ්‍යාව 3870 ක් විය. මෙම වෙනසට ආසන්නතම හේතුව වන්නේ ණය අයදුම් කළ සියළු දෙනාම ණය ලබා ගැනීම සඳහා ණය ලබා ගැනීම සඳහා ඉදිරිපත් නොවීම දැක්විය හැක.

2.3 නිකුත් කල ණය සීමාවන් හා ණය මුදල් වටිනාකම

2019 වසරේ සිට වැඩි පොළී ආදායමක් ලබා ගැනීම සඳහා රු.175,000.00 ක නව ණය බාණ්ඩ ක්‍රමයක් ආරම්භ කරන ලදී.මේ තුලින් 2019 වසරේ ණය ඉල්ලුමේ සාධනීය වර්ධනයක් දක්නට ලැබිණි. මෙම වසර තුල ණය ප්‍රමාණය 6.43% කින් සහ ණය මුදල් ප්‍රමාණයෙහිද පෙර වසරට සාපේක්ෂව 31.73% ඉතා සාධනීය වර්ධනයක් අත්පත් කර ගැනීමට සමත්ව ඇත.

වගුව 05 - ණය මුදල් සීමාවන් අනුව ප්‍රගතිය.

උපරිම ණය සීමාව (රු.)	නිකුත් කල ණය සංඛ්‍යාව	ණය මුදල් වටිනාකම (රු.)
300,000	101	30,300,000
250,000	169	42,250,000
175,000	820	143,500,000
100,000	2238	223,800,000
50,000	496	24,800,000
40,000	24	960,000
30,000	17	510,000
20,000	05	100,000
10,000	0	0
එකතුව	**3870**	**466,220,000**

2.4 ණය අයකරගැනීමේ ප්‍රගතිය

2016 සිට 2019 දක්වා වසර වලට අදාලව ණය මුදල් නිකුත් කිරීම හා අයකර ගැනීමේ ප්‍රගතිය 06 වන වගුවෙන් හා 03 වන ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරේ.

- ණය මුදල් නිකුත් කිරීම - වැඩි වීම - 31.73%
- ණය අයකර ගැනීමේ - ප්‍රගතිය - 15%

වගුව 06 – 2016 සිට 2019 වසර දක්වා ණය නිකුත් කිරීම සහ ණය අය කර ගැනීම

වර්ෂය	ණය සංඛ්‍යාව	ණය නිකුත් කිරීම (රු. 000)	ණය අයකර ගැනීම (රු. 000)
2016	3676	305,000	342, 358
2017	4062	365,720	389,506
2018	3636	353,970	411,062
2019	3870	466,220	473,881

ප්‍රස්තාරය -03 ණය නිකුත් කිරීම සහ අයකර ගැනීමේ ප්‍රගතිය



2.5 කාර්යාල සංකීර්ණය - ලෝහෝර් ආර්යා ණය අරමුදල

2.5.1 කුලී ආදායම

ලෝහෝර් ආර්යා ණය අරමුදල් ගොඩනැගිල්ලේ වර්ග අඩි 5,500 ක් අරමුදලේ කාර්යාලය සඳහා භාවිතා කරමින් අතිරික්ත ඉඩකඩ ප්‍රමාණය පහත සහන් ආයතන වලට කුලී පදනම මත ලබා දී 2019 වර්ෂය තුල කුලී ආදායම වශයෙන් රුපියල් මිලියන 16.5 උපයා ගන්නා ලදී.

වගුව 07 – 2019 වසරේ ගොඩනැගිලි කුලී ආදායම

අනු අංක	ආයතනය	කුලියට සිටින මහල	වර්ග අඩි ප්‍රමාණය	ආදායම (රු.)
01	ලෝහෝර් ආර්යා ණය අරමුදල	3 වන මහල	5500	-
02	රථ ගාල	පතුල් මහල	5290	-
03	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	බිම් මහල	5500	6,430,000
04	සමූපකාර සේවක කොමිෂන් සභාව	1 - මහල	2415	2,398,081
05	ලංකා විදුලිබල මණ්ඩලය	1 ,2 - මහල	4700	4,750,000
06	ලංකා විදුලිබල මණ්ඩලය තොරතුරු අංශය	2 - මහල	2750	2,805,096
07	රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂම	2 - මහල	840	-
08	ඒ.ජේ.එස්. ඇසෝසියේටඩ් ආයතනය	අංක :100/20	380	135,000
			27,375	**16,518,178**

2.5.2 අරමුදලෙහි තිරසාරභාවය

අරමුදලේ මෙහෙයුම් සහ මුල්‍ය තිරසාරභාවය පවත්වා ගැනීම සම්බන්ධයෙන් භාරකාර මණ්ඩලයේ දැඩි අවධානය යොමුව ඇත. මෙම ආයතනය භාණ්ඩාගාරය මත හෝ අයවැය ලේඛන ප්‍රතිපාදන මත යැපෙන ආයතනයක් නොවන අතර සේවක වැටුප් ඇතුළුව සියලුම වියදම් මෙහි පොලී ආදායම සහ ගොඩනැගිලි කුලී ආදායම තුලින් දරනු ලැබේ.පොලී ආදායම තුල මෙහෙයුම් විරස්ථායී බව සහතික කරනු ලබන අතර බොල් ණය, අනෙකුත් පරිපාලන වියදම් සහ ණය ආපසු අයකර ගැනීම සඳහා දැරීමට සිදුවන අනෙකුත් සියලුම වියදම් ද මෙම ආදායම තුල ආවරණය කරගැනීමෙන් අනතුරුව මහජන බැංකුවේ සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවල කර ඇති ස්ථාවර තැන්පතුවල ආයෝජනයෙන් ලැබෙන ස්ථාවර තැන්පතු පොලී ඉපයීම් යොදා ගනී.

වගුව 08 – ආයෝජන

ආයෝජන වර්ගය	බැංකුව	2019/12/31 (රු.)	2018/12/31 (රු.)
ස්ථාවර තැන්පතු	මහජන බැංකුව	50,416,780.80	89,623,435
ස්ථාවර තැන්පතු	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	20,579,816.20	18,713,176
එකතුව		**70,996,597**	**108,336,611**

2.5.3 මෙහෙයුම් ආදායම

2019 වසර තුලදී මුළු මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 111 ක් වූ අතර ශුද්ධ මෙහෙයුම් අතිරික්තය රුපියල් මිලියන 42.1 කි. 2018 වසර තුලදී මෙහෙයුම් ආදායම හා ශුද්ධ මෙහෙයුම් අතිරික්තය පිළිවෙලින් රුපියල් මිලියන102 ක් හා රුපියල් මිලියන 38.1 ක් විය . ස්ථාවර තැන්පතු පොළි ආදායම් වර්ධනය වීමත්, අනෙකුත් ආදායම් ඉහල යාමත්, මුදල් අමාත්‍යාංශය වෙතින් 2015 වසරේ ලැබුණු මෝටර් රථ 2ක් සඳහා ගෙවීම් සහ පවරා දීමෙන් අනතුරුව මුදල් අමාත්‍යාංශය - පරිත්‍යාග ලෙස අවසන් ගිණුම් වල පෙන්නුම් කරන ලැබුණු මුදල 2016-2020 වසර දක්වා ලාභයට එකතු කල යුතු බැවින් එම වටිනාකමින් 2018ට සහ 2019ට අයත් කොටස් වර්ෂයේ ආදායමට එකතු වීමත් හේතුවෙන් මෙහෙයුම් ආදායම 2018 සාපේක්ෂව 2019 වර්ෂයේදී 10.5% කින් වර්ධනය වීමක් අත්පත් කරගෙන ඇත.

ප්‍රස්තාරය 4 - මෙහෙයුම් ආදායම සහ මෙහෙයුම් අතිරික්තය 2016 – 2019



03

සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය

3.1 දැනුම හා පුහුණු ධාරිතාවය ඉහල නැංවීම සඳහා කාර්ය මණ්ඩල පුහුණුවීම් - 2019

අනු අංකය	දිනය	මෙහෙය වූ ආයතනය	වැඩමුළුවේ නම	සහභාගි වූ අයවළුන් සහ තනතුරු
01	2019.01.21 2019.01.22	නිපුණතා සංවර්ධන අරමුදල	ප්‍රසම්පාදන ක්‍රමවේදය	ගිණුම් නිලධාරී - 01
02	2019.01.24 2019.01.25	නිපුණතා සංවර්ධන අරමුදල	රියදුරන් සඳහා විනය හා කාර්යාලීය විධි	රියදුරු 111 - 01
03	2019.01.28 2019.01.29	නිපුණතා සංවර්ධන අරමුදල	කාර්යාල ක්‍රම සහ කාර්යාල කළමනාකරණය	කළමනාකරණ සහකාර 111 - 03
04	2019.01.29	නිපුණතා සංවර්ධන අරමුදල	දේපළ/උපකරණ සබැඳිව ස්ථීර වත්කම් පවත්වාගෙන යාම , නඩත්තු කිරීම	කළමනාකරණ සහකාර 111 - 01
05	2019.02.25 2019.02.26	නිපුණතා සංවර්ධන අරමුදල	කාර්යාල උපකරණ පිලිබඳ පාලනය	කළමනාකරණ සහකාර 111 - 01
06	2019.03.14 2019.03.15	නිපුණතා සංවර්ධන අරමුදල	රාජ්‍ය ආයතනවල අවසාන ගිණුම් පිලියෙල කිරීම සඳහා බලපාන මූලික ගිණුම්කරණ සංකල්ප හා ගිණුම්කරණ ප්‍රමිති	ගිණුම් නිලධාරී - 01
07	2019.04.04	CETRAC ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය	“රියදුරන් සඳහා විද්‍යාත්මක, පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම	රියදුරු 111 - 01
08	2019.04.05	CETRAC ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය	පරිපාලන නීති සහ මානව සම්පත් කළමනාකරණය	පරිපාලන නිලධාරී - 01
09	2019.05.30 2019.05.31	නිපුණතා සංවර්ධන අරමුදල	වර්තමාන කාර්යාල ක්‍රම හා කාර්යාල කළමණාකරණය	කළමනාකරණ සහකාර 111- 01
10	2019.06.06 2019.06.07	නිපුණතා සංවර්ධන අරමුදල	රාජ්‍ය ගිණුම්කරණ ක්‍රමවේදය හා භාණ්ඩාගාරයේ ගනුදෙනු ගිණුම්ගත කිරීම	කළමනාකරණ සහකාර 111- 01
11	2019.06.17	නිපුණතා සංවර්ධන අරමුදල	නිල බැංකු ගිණුම් නඩත්තුව	කළමනාකරණ සහකාර 1- 01 (මුදල් අයකැමි)
12	2019.06.19 2019.06.26 2019.07.19	නිපුණතා සංවර්ධන අරමුදල	Three Day Workshop on Advanced Excel	ගිණුම් නිලධාරී - 01
13	2019.07.11 2019.07.12	නිපුණතා සංවර්ධන අරමුදල	තොරතුරු තාක්ෂණයට අදාල භාණ්ඩ ප්‍රසම්පාදනය සහ ඇගයීම	තොරතුරු තාක්ෂණ නිලධාරී - 01

14	2019.07.18 2019.07.19	නිපුණතා සංවර්ධන අරමුදල	රියදුරන් සහ කාර්යාල කාර්ය සහයකයින් සඳහා විනය හා කාර්යාලීය ආචාර විධි	කාර්යාල කාර්ය සහයක 111 - 02
15	2019.09.23 2019.09.24	නිපුණතා සංවර්ධන අරමුදල	Customer care and Service Excellence	කළමනාකරණ සහකාර 1 - 01 කළමනාකරණ සහකාර 111 – 01
16	2019.09.26 2019.09.27	නිපුණතා සංවර්ධන අරමුදල	නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම	කළමනාකරණ සහකාර 1 - 01
17	2019.10.21 2019.10.22	නිපුණතා සංවර්ධන අරමුදල	Telephone skills and Etiquette training for secretaries, front office staff and customer care officers	කළමනාකරණ සහකාර 111 – 1
18	2019.10.28 2019.10.29	නිපුණතා සංවර්ධන අරමුදල	,,	කළමනාකරණ සහකාර 1 - 01
19	2019.11.07 (දින ½)	නිපුණතා සංවර්ධන අරමුදල	Positive thinking and Work place etiquette	කළමනාකරණ සහකාර 1 - 01 කළමනාකරණ සහකාර 111 – 3
20	2019.11.08	නිපුණතා සංවර්ධන අරමුදල	Communication skills for emerging leaders	ගණකාධිකාරී - 01
21	2019.11.28 2019.11.29	මුදල් අමාත්‍යාංශයේ පුහුණු කිරීමේ අංශයේ මිලෝදා - මුල්‍ය ආයතනයේ තොරතුරු සන්නිවේදන සහ ඩිජිටල් කළමනාකරණ පාසල	Advanced MS Excel for government officers	කළමනාකරණ සහකාර 111 – 1
22	2019.01.02 සිට 2019.02.22 දක්වා (පැය 50 ක ඉගැන්වීම් කොන්ත්‍රාත් කාලය සම්පූර්ණ කිරීම සඳහා ඉගැන්වීමට ඉතිරි වූ පැය 07 ක කාලය ආවරණය කිරීම)	කේ. තයානිදි ගුරුමහත්මිය රා.ප.වක්‍රලේඛ 4/2014 දැක්වෙන පුහුණු ගුරු සංචිතය රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ නිර්දේශිත	කළමනාකරණ සහකාර 111 ශ්‍රේණිය දෙමළ භාෂා ප්‍රවීනත්වය	ලෝහෝර් ආර්යා ණය අරමුදලේ කළමනාකරණ සහකාර 111 ශ්‍රේණිය - දෙමළ භාෂා ප්‍රවීනත්ව විභාගයට පෙනී සිටින කාර්ය මණ්ඩලය සඳහා දෙමළ භාෂා පංති පැවැත්වීම රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ නිර්දේශිත රා.ප.වක්‍රලේඛ 4/2014 න් පෙන්වා දෙන ගුරුවරු සංචිතයේ ලියාපදිංචි ගුරුවරයෙකු වන කේ. තයානිදි ගුරුමහත්මියගේ ඉගැන්වීම යටතේ පුහුණු වීම.

නවක නිලධාරීන් සඳහා වන කාර්යාල ක්‍රමවේද හඳුන්වා දීමේ මූලික පුහුණුව (Introduction Programme), රාජකාරී විෂයානුබද්ධ දැනුම ලබා දීම, කණිෂ්ඨ කළමනාකරුවන් සඳහා තම රාජකාරී විෂයානුබද්ධ දැනුම ලබාදීම සහ කණිෂ්ඨ සේවක මණ්ඩලය සඳහා ආයතනයේ රාජකාරීන් ඉටු කිරීම , කාර්යාල සංස්කෘතියට අනුගත වීම ඇතුළුව තමන් ඉටු කරනු ලබන රාජකාරීන් සම්බන්ධවද පුහුණු පාඨමාලාවන් සඳහා යොමු කිරීම තුලින් ආයතනයේ රාජකාරීන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකර ගැනීමත් පුහුණු අවශ්‍යතාවය ඇති ඉලක්කගත පිරිසක් සැලැස්මකට අනුව කාර්ය මණ්ඩල පුහුණුව සඳහා යොමු කිරීමට හැකි වීමත් මෙම වසරේ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ක්‍රියාවලියේ කැපී පෙනුනු සුවිශේෂී ලක්ෂණයන් කිහිපයකි.

කාලීන මාතෘකාවක් යටතේ මෙන්ම විෂයානුබද්ධව පවත්වන ලද වැඩමුළු සඳහා සුදුසු පරිදි මෙන්ම සේවක අවශ්‍යතාවය අනුවද පුහුණු වැඩසටහන් වලට අනුයුක්ත කිරීම හා කාර්ය මණ්ඩල පුහුණුව සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම, සැලසුම් සහගත කාර්ය මණ්ඩල පුහුණු ක්‍රියාවලියේ ප්‍රධාන අරමුණ විය.

මෙම වසර තුල පුහුණු වැඩමුළු සඳහා වඩාත් සැලසුම් සහගත ලෙස යොමු කරන ලද අතර ඒ තුලින් ලබාගත් දැනුම හා කුසලතා භාවිතයෙන් තම රාජකාරී කටයුතු විධිමත්ව හා ක්‍රමානුකූලවත් ,කාර්යක්ෂම හා ඵලදායී ලෙසත්, සිදු කිරීමට කාර්ය මණ්ඩලයට හැකියාව ලැබුණි. ලෝහෝර් ආර්යා ණය අරමුදලේ දැක්ම, මෙහෙවර හා අරමුණු වලට අනුගතව වඩාත් ඵලදායීව තම වෘත්තීය ජීවිතය හැඩගස්වා ගැනීමට මෙම වසරේ පුහුණු සැලැස්ම ඉවහල් වී ඇති බව අවධාරණය කළ යුතුව ඇත.

එමෙන්ම පුහුණු වැඩසටහනන් සඳහා යොමු කල කාර්ය මණ්ඩලය එකී පුහුණු වැඩමුළු වලින් ලබාගත් දැනුම සෙසු කාර්ය මණ්ඩලය සමග බෙදා ගැනීමටත්, සෙසු කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමටත්, අවස්ථාව සලසමින් සෑම මසකම පවත්වන ලද කාර්ය මණ්ඩල රැස්වීමේදී තමා සහභාගී වූ පුහුණු වැඩසටහන පිලිබඳව හා ඉන් ලබාගත් දැනුම, අත්දැකීම පිලිබඳවද, එහි අඩු පාඩු හා ප්‍රයෝජන පිළිබඳවද , ඉදිරිපත් කිරීම (Power-point presentation) සඳහා අවස්ථාවක්ද ලබා දෙන ලදී.

මෙම අවස්ථාව මගින් කණිෂ්ඨ කාර්ය මණ්ඩලයට මෙන්ම සමස්ථ කාර්ය මණ්ඩලයටම කුඩා සමූහයක් ඉදිරියේ තම අත්දැකීම් පිලිබඳව දැනුවත් කිරීමේ හැකියාව , සෘජුව හා පැහැදිලිව සන්නිවේදන හැකියාව වර්ධනය කර ගැනීමටද අවස්ථාවක් සැලසිණි. මෙය තම වෘත්තීය මෙන්ම පෞද්ගලික ජීවිතයට මෙන්ම පෞරුෂ වර්ධනයටද නායකත්වයට හා සන්නිවේදන හැකියාව වර්ධනය කරගැනීමට මහඟු අවස්ථාවක් වූවා නිසැකය.

පිලිගත් ප්‍රමිතිගත බාහිර ආයතනයකින් විවිධ විෂයන් ඔස්සේ පැවැත්වෙන විවිධ වැඩමුළු සඳහා කාර්ය මණ්ඩලය යොමු කිරීමෙන් ඒ ඒ විෂය ක්ෂේත්‍රයන් පිලිබඳව දැනුම ලබා දීම , කාර්යාල ක්‍රමවේද පිලිබඳ නිවැරදි අවබෝධය ලබාදීම, නිවැරදි කාර්යාල පරිවයන් හා ක්‍රමෝපායන් හඳුන්වාදීම සහ නව තත්ව සහ ප්‍රමිති පිලිබඳ දැනුම ලබා දී දැනුම යාවත්කාලීන කිරීමට කටයුතු කිරීමට හැකිවිය. එය වසරේ කාර්ය මණ්ඩල පුහුණුවේදී දක්නට ලැබුණු සුවිශේෂ තත්ත්වයකි.

<u>බැහැරගත එළිමහන් පුහුණුව.</u>

සමස්ථ කාර්ය මණ්ඩලය එකවර එළිමහන් පුහුණුවේ යෙදවීම, විවේකාශ්වාදය ලබා ගැනීම සහ කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ද ඇතුළුව විවේකය හා විනෝදාශ්වාදය ලබා ගැනීමේ අරමුණින් කොළඹින් කිලෝමීටර් 30 ක් එපිටින් පිහිටි දුම්කොළහේන පාර, තුන්මෝදර, අවිස්සාවේල්ලෙහි සීතාවක මිරැකල් නේචර් රිසෝර්ට්ස් (Seethawaka Miracle Nature Resorts) නිවාඩු නිකේතනය වෙත එක්දින චාරිකාවක් හා බැහැරගත පුහුණුව 2019 දෙසැම්බර් 07 වන දින සංවිධානය කරන ලදී.

මෙම එක්දින බැහැරගත පුහුණු වීම හා විවේක හමුවට කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 22 ද ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් ඇතුලත්ව මුළු සාමාජිකයින් 47 දෙනකු සහභාගී වන ලදී.

2019 පවත්වන ලද බැහැරගත පුහුණුව පුර්ව වසර වලදී කාර්ය මණ්ඩලය සහභාගී වූ බැහැරගත පුහුණු වීම් වලින් වෙනස් වන්නේ තම පවුල් වල සාමාජිකයින්ද සමග පුහුණු කටයුතු වල යෙදීමට හැකි වීම සහ ඉන් කාර්යාලීය ජීවිතය මෙන්ම පෞද්ගලික ජීවිතයද හැඩගස්වා ගැනීමට පිටුවහලක් වීම හේතුවෙනී.

සීතාවක මිරැකල් හී එළිමහන් පුහුණු ක්‍රියාකාරකම් කිහිපයක නිරත වීමට හැකි වීම මගින් ඒකාකාරී රැකියා ජීවිතයෙන් මදක් මිදී විනෝදාශ්වාදයක්ද ලබා ගැනීමට හැකි විය. මෙම ක්‍රියාකාරකම් අතර ඉලක්කයට වෙඩි තැබීම , කඳු තරණය , ජල මාර්ග තරණය ,ජල ක්‍රීඩා , ක්‍රිකට්,බැඩ්මින්ටන්, වොලිබෝල් වැනි එළිමහන් ක්‍රීඩාද කැරම් ක්‍රීඩා වැනි ගෘහස්ථ ක්‍රීඩාද විය. එමෙන්ම මෙම එක්දින හමුවේදී මත්ස්‍ය සම්භාහනය, සංගීතයට අනුව නර්ථනයේ යෙදීම ආදි විනෝදාශ්වාදය ගෙන දෙන ක්‍රියාකාරකම් වලද යෙදීමට අවස්ථාව සැලසුණි.

මෙමගින් කණ්ඩායමක් ලෙස එක්ව අභියෝග වලට මුහුණ දෙමින් කණ්ඩායම් හැඟීමෙන් සාමූහිකව එකට එක්ව ජය ගැනීම මෙන්ම සිහිබුද්ධිය , ආත්ම විශ්වාසය ගොඩනගා ගනිමින් ආයතනයක් වශයෙන් ඉදිරියට ගමන් කළ යුතු ආකාරය පිලිබඳව පුහුණුවක් ලබා ගැනීමට හැකි විය. තවද දිගින් දිගටම රාජකාරී කටයුතු වල නිරත වීම මගින් ඇති වී තිබූ මානසික ආතතියෙන් මදක් මිදීමට මෙමගින් මහත් පිටුවහලක් ලැබුණි.

- එළිමහන් පුහුණුව සහ විවේකාශ්වාදය ලබා දීමට සංවිධානය කරන ලද එළිමහන් ක්‍රියාකාරකම්හි විශේෂ අවස්ථා.












3.2 අරමුදලේ බඳවා ගැනීමේ හා උසස්වීමේ පරිපාටින්.

<u>උසස්වීම් හා නව බඳවා ගැනීම්</u>

3.2.1 2019 වසරේදී අරමුදල් කණිෂ්ඨ කාර්ය මණ්ඩලය වෙත උසස්වීම් දෙකක් ලබා දී ඇත. 2019.03.21 වන දින කාර්යාල සභයක 111 තනතුර දරණ නිලධාරියෙකු කා.කා.ස.11 තනතුරටද 2019.04.10 වන දින සිට එක් රියදුරෙකු 11 වන ශ්‍රේණියටද උසස් කර ඇත.

3.2.2 2019 වසර තුල කළමනාකරණ සහකාර නිලධාරීන් 05 දෙනකු සේවයෙන් ඉල්ලා අස්වූ අතර එක් කළමනාකරණ සහකාර නිලධාරියෙකුගේ පත්වීම අවලංගු වුයෙන් අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලය තුල පුරප්පාඩු වූ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරු සඳහා අයදුම්පත් කැඳවා අරමුදලේ නිල වෙබ් අඩවිය මගින් සහ පුවත්පත් දැන්වීම් හරහා ප්‍රචාරණය කිරීමෙන් පසු ආකර්ෂණය කරගත් අයදුම්පත් අතරින් විනිවිදභාවයකින් යුක්තව සුදුසු අයදුම්කරුවන් තෝරා විධිමත් සම්මුඛ පරීක්ෂණ මෙහෙයවීම මගින් කළමනාකරණ සහකාර 111 තනතුර සඳහා නවක නිලධාරීන් 05 දෙනකු අරමුදලට බඳවා ගන්නා ලදී.

2019.12.31 වන විට කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරු 05 ක්ද කළමනාකරණ සහකාර (තාක්ෂණික) තනතුරු 01 ක්ද කාර්යාල කාර්ය සහායක තනතුර 01 ක්ද වශයෙන් පුර්ණ පුරප්පාඩු සංඛ්‍යාව 07 ක් විය.

3.3 අරමුදල් පරිශ්‍රය නවීකරණය කිරීමේ කටයුතු

2019 වර්ෂය තුල සංශෝධිත ප්‍රමාණ පත්‍රයේ සියළු අළුත්වැඩියාවන් සම්පූර්ණයෙන්ම නිම කිරීම සිදු කර ඇත.

3.4 කාර්ය මණ්ඩල පරිපාලන සහ කාර්යාලීය ක්‍රමවේදයන් විධිමත් කිරීම

- **අනුමත වාර්ෂික පුහුණු සැලැස්මට අනුව කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.**

  භාරකාර මණ්ඩලය මගින් අනුමත කරන ලද වාර්ෂික පුහුණු සැලැස්මට අනුව නවක මෙන්ම ස්ථීර කාර්ය මණ්ඩලය පුහුණු කිරීම තුලින් ආයතනික කටයුතු විධිමත්ව හා ක්‍රමානුකූලවත් කාර්‍යක්ෂම හා ඵලදායී ලෙසත් ඉටු කිරීමට හැකි වීම, වඩා ගුණාත්මක සේවාවක් සේවාදායකයින් වෙත ලබා දීමට හැකි වීම හා කාර්ය මණ්ඩලය තෘප්තිමත්භාවය ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකි වීම යන කරුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වීම.

- **නව කාර්ය සාධන ඇගයීම් ක්‍රමය.**

  869 වන භාරකාර මණ්ඩල අනුමැතියට අනුව 2019 මැයි මස සිට නව කාර්ය සාධන ඇගයීම් ක්‍රමයට අනුව කාර්ය මණ්ඩලයේ සියළුම නිලධාරීන්ගේ කාර්ය සාධනය ඇගයීම ආරම්භ කරන ලදී. ඒ අනුව 2019 මැයි මස සිට නව ක්‍රමයට අනුව සම්මුඛ පරීක්ෂණයන්ට ලක් කරමින් පියවර කිහිපයකින් යුක්ත කාර්ය මණ්ඩලයේ කාර්ය සාධන ඇගයීම් ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

- **කාර්ය මණ්ඩල උසස්වීම් සඳහා කඩයිම් පරීක්ෂණ හා භාෂා ප්‍රවීනතා විභාග පැවැත්වීම.**

  2019.04.25 වන දින කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද විවිධ මට්ටමේ කඩඉම් පරීක්ෂණ 02 කට සහ භාෂා ප්‍රවීනතා විභාගයට පෙනී සිටීමට කාර්ය මණ්ඩලයට අවස්ථාව සලසා දෙන ලදී. මෙම කඩඉම් පරීක්ෂණයන්ට මුහුණ දුන් නිලධාරීන් 11 දෙනකු සාර්ථකව පරීක්ෂණ වලින් සමත් වන ලදී. 1 වන හා 11 වන ශ්‍රේණියේ කඩඉම් පරීක්ෂණ වලට මුහුණ දුන් නිලධාරීන් 16 දෙනෙකුගෙන් 11 දෙනෙකුද 1 වන මට්ටමේ දෙමළ භාෂා ප්‍රවීනතා විභාගයට පෙනී සිටි නිළධාරී 6 දෙනෙකුගෙන් 5 දෙනෙකු ද සමත් වී ඇත.

- **කාර්ය මණ්ඩල රැස්වීම්.**

  අංශ ප්‍රධානීන්ගේ කාර්ය මණ්ඩල රැස්වීම 2019 වසර තුලද අඛණ්ඩව මාසිකව පැවැත් වූ අතර ත්‍රෛමාසිකව පවත්වන සමස්ථ කාර්ය මණ්ඩල රැස්වීමද පැවැත්වීම තුලින් කාර්ය මණ්ඩලයේ විටින් විට පැන නගින ගැටළු සාර්ථකව විසඳීමට හැකි වීම හා විටින් විට ඉදිරිපත් කරන යෝජනා සහ ඉල්ලීම් සාධාරණීකරණය කර ඉටු කිරීමට පියවර ගැනීමට හැකි වීම.

- **කාර්ය මණ්ඩලය වෙත අරමුදලින් නිකුත් කරන ටී ෂර්ටය.**

  සතියේ සිකුරාදා දින පමණක් රාජකාරියට වාර්තා කිරීමේදී කාර්යාලයට සැරසී පැමිණිය යුතු නිල ඇඳුම ලෙස අරමුදලේ නාමය සහ නිල ලාංඡනය යොදා සකසන ලද ටී ෂර්ටය (T- Shirt) 2019 වසර සඳහාද කාර්ය මණ්ඩලය වෙත නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

3.5 කාර්ය මණ්ඩල ණය

ආයතනික කාර්ය මණ්ඩල ණය ක්‍රමවේදයේ කිසිදු වෙනසක් සිදු නොකරන ලදී.

3.6 ඉඩම් ඔප්පු සහ බැදුම්කර.

අරමුදල ආරම්භ කළ අවධියේදී, ඉඩම් (ඔප්පු) ඇපයට තබා ණය ලබා ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වී ඇත. මෙම ක්‍රමය යටතේ ණය ලබා දුන් ඇප බැදුම්කර 267 ක් 1960 වසරේ සිට මෙම ආයතනයට වගකීමක්ව පවතී. මෙම ක්‍රමය යටතේ ණය දීම තවදුරටත් ක්‍රියාත්මක නොවන බැවින් විධිමත් විගණන කමිටු නිර්දේශයකින් අනතුරුව , එම බැදුම්කර අදාළ දේපළ පිහිටා ඇති ප්‍රදේශ අනුව එම දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයවලට බැදුම්කර නිදහස් කර ඒවායේ සඳහන් පාර්ශවයන් නමින් එකී අවලංගු කිරීම් ලියාපදිංචි කර තවදුරටත් මෙම ආයතනය වෙත පැවරී ඇති වගකීම අවසන් කිරීමට 831 භාරකාර මණ්ඩල විසින් අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව 2016.12.31 දින වන විට බැදුම්කර 191 නිදස් කිරීමට හැකි විය.

3.7 රැස්වීම්.

2019 වසර තුල භාරකාර මණ්ඩල රැස්වීම් 10 කුත් කාර්යමණ්ඩල රැස්වීම් 09 කුත් මාසිකව පවත්වන ලදී. මීට අමතරව ත්‍රෛමාසික කාර්ය මණ්ඩල රැස්වීම් 03 ක් පවත්වන ලදී. කාර්යමණ්ඩල රැස්වීම් වලදී සාකච්ඡා කරන ලද වැදගත් කරුණු භාරකාර මණ්ඩල අනුමැතිය ඇතිව ක්‍රියාත්මක කරන ලදී.

3.8 විගණන හා කළමණාකරණ කමිටුව.

2019 වසරේ විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් 04 ක් පහත සඳහන් පරිදි පවත්වන ලදී. විගණන විමසුම් සම්බන්ධ ලේඛණ යාවත්කාලීන කොට භාරකාර මණ්ඩලයේ උපදෙස් සඳහා ඉදිරිපත් කිරීමටද කටයුතු කර ඇත.

අනු අංකය	කමිටු පැවත් වූ දින
1	**2019.05.07**
2	**2019.05.21**
3	**2019.07.11**
4	**2019.10.08**

04

අනාගත සැලසුම්

- වර්තමානයේ රාජ්‍ය සේවකයන්ට පමණක් සපයනු ලබන ලෝහෝර් ආර්යා ණය අරමුදලේ මූල්‍ය පහසුකම් අනාගතයේ දී පෞද්ගලික අංශයේ සේවකයින්ට ද ලබා දීමට හැකි වන පරිදි මුදල් උත්පාදනය කර ගැනීම සඳහා ලෝහෝර් ආර්යා අරමුදල් පනතේ වගන්ති වර්තමානයට ගැලපෙන අයුරින් සංශෝධනය කිරීම.

- අරමුදල සේවා සම්පාදන මට්ටමේ ණය දෙන ආයතනයක් බවට පත්කොට එහි වපසරිය සහ ක්‍රියාකාරකම් ණය ලාභීන්ට ප්‍රයෝජනවත් පරිදි වෙනස් කිරීම.

Ranwatta & Co.
CHARTERED ACCOUNTANTS
SUMITH RANWATTA MBA, FCA, FCMA, FMAAT, FCPM

141/3, 2ND FLOOR, VAUXHALL STREET,
COLOMBO 02, SRI LANKA.
TEL : +94 11 2543148,
: +94 11 2543149, +94 11 2543011
FAX +94 11 4716922
E-mail: sumith@ranwattaco.lk
ranwatta@sltnet.lk

ස්වාධීන විගණකගේ වාර්තාව

ලෝහෝර් ආර්යා ණය අරමුදල් සාමාජිකයන් වෙත

මූල්‍ය ප්‍රකාශන විගණනය මත වාර්තාව

මතය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය තත්ව ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයන් සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත ලෝහෝර් ආර්යා ණය අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදි.

2019 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර.) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව අප විසින් දරන්නා වූ මතය වේ.

මතය සඳහා පදනම

අප විසින් අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන ලදී. එම ප්‍රමිතීන්ට අනුකූලව අපගේ වගකීම් පිළිබඳව අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම යන ඡේදය යටතේ වැඩිදුරටත් විස්තර කෙරේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආචාර ධර්ම සංග්‍රහයේ සඳහන් ආචාර ධර්ම අවශ්‍යතාවයන්ට අනුකූලව අපගේ මූල්‍ය ප්‍රකාශන විගණනයට අදාළ වන පරිදි අප අරමුදලෙන් ස්වාධීන විගණකවරු ලෙස කටයුතු කරන අතර, ආචාර ධර්ම සංග්‍රයයේ දැක්වෙන අනෙකුත් වෘත්තීය ආචාර ධර්මයන්ට අනුකූලව ද අප විසින් කටයුතු කර ඇත. අප ලබා ගත් විගණන සාක්ෂි අපගේ මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය බව අප විශ්වාස කරමු.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ කළමනාකාරිත්වයේ සහ පාලනය පිළිබඳ වගකිව යුතු පාර්ශවයන්ගේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකාරිත්වයේ වගකීම වන අතර, එකී මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු වීම සඳහා අවශ්‍යයැයි හැඟෙන අභ්‍යන්තර පාලනයන් හඳුන්වා දී භාවිතා කිරීමට ද කළමනාකාරිත්වය වගකීමෙන් බැඳේ . ආයතනය ඇවර කිරීමට හෝ මෙහෙයුම් කටයුතු නැවැත්වීම තීරණය කර ඇති විටක හෝ ඉහත විකල්පයන් හැර වෙනත් විකල්පයක් නොමැති අවස්ථාවක හැර ආයතනය විසින් අඛණ්ඩ පැවැත්ම උපකල්පනයට අනුකූලව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම කළමනාකාරිත්වයේ වගකීම වේ .සමාගමේ පාලනය පිළිබඳ වගකිව යුතු පාර්ශවයේ වගකීම වනුයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම වේ .

මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ අපගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම අපගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම් පිළිබඳ වැඩිදුර විස්තරයක් ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති කමිටු වෙබ් අඩවිය :http://slaasc.com/auditing/auditorsresponsibility.php.හි සඳහන් කර ඇත. මෙම විස්තරය අපගේ විගණක වාර්තාවේ කොටසකි.

වරලත් ගණකාධිකාරීන්
දිනය : 27/08/2020
කොළඹ 02.

ලෝහෝර් ආර්යා ණය අරමුදල
2019 දෙසැම්බර් 31 දිනට
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

	සටහන	31/12/2019 රු.	31/12/2018 රු.
පොලී ආදායම	5	108,730,354	98,727,034
අනෙකුත් ආදායම්	6	2,950,113	3,547,090
		111,680,467	102,274,124
මෙහෙයුම් වියදම්			
පුද්ගල වැටුප් වියදම්	7	(31,550,905)	(31,139,837)
භූමිය, උපකරණ, ආයතනික වියදම්	8	(20,648,233)	(20,870,099)
ගාස්තු සහ කොමිස්	9	(1,394,005)	(610,401)
		(53,593,143)	(52,620,337)
බදුකරණයට පෙර ලාභය		58,087,324	49,653,787
බදු වියදම්	10	(15,940,799)	(11,548,464)
වර්ෂය සඳහා ලාභය		42,146,525	38,105,323

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සම්බන්ධ කර කියවිය යුතුයි. එමෙන්ම සටහන් මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය අංගයක් වේ.

	සටහන	31/12/2019 රු.	31/12/2018 රු.
වත්කම්			
ජංගම වත්කම්			
මූල්‍යමය හා කෙටි කාලීන වත්කම්	11	**28,335,925**	21,897,378
ණය සහ අත්තිකාරම්	12	**454,619,719**	365,865,895
භාණ්ඩ ලේඛණ		**252,330**	236,796
අනෙකුත් වත්කම්	13	**1,818,761**	3,840,074
		485,026,735	391,840,143
ජංගම නොවන වත්කම්			
ස්ථාවර තැම්පතු මත ආයෝජනය	14	**73,060,699**	114,623,905
දේපළ පිරියත හා උපකරණ	15	**85,183,310**	91,305,486
ආයෝජන (දේපල)	16	**27,238,094**	28,228,570
		185,482,103	234,157,961
මුළු වත්කම්		**670,508,838**	625,998,104
ජංගම වගකීම්			
අනෙකුත් වගකීම්	17	**11,660,192**	11,914,584
ආදායම් බදු	18	**7,284,797**	5,212,534
		18,944,989	17,127,118
ජංගම නොවන වගකීම්			
පරිත්‍යාග - මුදල් අමාත්‍යාංශය	19	**2,093,230**	4,186,455
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	20	**17,295,208**	14,669,757
		19,388,438	18,856,212
මුළු වගකීම්		**38,333,427**	35,983,329
ශුද්ධ වත්කම්		**632,175,411**	590,014,775
ශුද්ධ වත්කම්			
සමුච්චිත අරමුදල		**485,525,825**	**443,365,189**
ප්‍රත්‍යා ගණන සංචිත		**146,649,586**	**146,649,586**
මුළු ශුද්ධ වත්කම්		**632,175,411**	**590,014,775**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සම්බන්ධ කර කියවිය යුතුයි. එමෙන්ම සටහන් මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය අංගයක් වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇති බවට මින් සහතික වෙමි.

.....
ගණකාධිකාරි

මෙම මූලය ප්‍රකාශන පිලියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම භාරකාර මණ්ඩලය විසින් දරනු ලැබේ.

භාරකාර මණ්ඩලය වෙනුවෙන් අත්සන්

.....
සභාපති

දිනය : 2020.09.10

.....
පාලන භාරකාර

දිනය : 2020.09.10

ලෝහෝර් ආර්යා ණය අරමුදල

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම් / ප්‍රාග්ධන වෙනස්වීම් ප්‍රකාශය

	ප්‍රත්‍යා ගණන සංචිතය	සමුච්චිත ලාභය රු.	මුළු ශුද්ධ වත්කම් රු.
2017.12.31 දිනට ශේෂය	146,649,586	405,244,938	**551,894,524**
පෙර වසර සඳහා වූ ගැලපීම්	-	14,928	**14,928**
වසරේ ලාභය	-	38,105,323	**38,105,323**
2018.12.31 දිනට ශේෂය	**146,649,586**	**443,365,189**	**590,014,775**
පෙර වසර සඳහා වූ ගැලපීම්	-	14,111	**14,111**
වසරේ ලාභය	-	42,146,525	**42,146,525**
2019.12.31 දිනට ශේෂය	**146,649,586**	**485,525,825**	**632,175,411**

ලෝහෝර් ආර්යා ණය අරමුදල
2019 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2019 රු.	2018 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
වසරේ ශුද්ධ ලාභය	58,087,324	49,653,787
ගැලපීම්		
ක්ෂය	8,200,315	8,308,649
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	2,625,451	2,993,545
පෙර වසර සඳහා වූ ගැලපීම්	14,111	14,928
රජයේ දීමනාවන්	(2,093,227)	(2,093,228)
ස්ථාවර තැම්පතු මත පොලී ආදායම	(7,721,536)	(11,391,223)
මෙහෙයුම් වත්කම් වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය	**59,112,438**	**47,486,458**
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහය		
භාණ්ඩ ලේඛන (වැඩිවීම්/අඩුවීම්)	(15,534)	39,459
ණය සහ අත්තිකාරම් (වැඩිවීම්/අඩුවීම්)	(88,753,820)	(20,947,985)
අනෙකුත් වත්කම් (වැඩිවීම්/අඩුවීම්)	2,021,313	583,373
අනෙකුත් වගකීම් (වැඩිවීම්/අඩුවීම්)	(254,392)	(1,133,335)
	(87,002,433)	**(21,458,488)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	(27,889,995)	26,027,970
පාරිතෝෂික ගෙවීම්	-	(638,254)
බදු ගෙවීම්	(13,868,537)	(7,756,381)
	(13,868,537)	**(8,394,634)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද/ භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(41,758,532)**	**17,633,336**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම්	(1,087,663)	(937,347)
ආයෝජන වල (වැඩිවීම්/අඩුවීම්)	41,563,206	(20,637,094)
ලද පොලී	7,721,536	11,391,223
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**48,197,079**	**(10,183,219)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය	-	-
මුදල් හා සමාන දෑ වල ශුද්ධ (වැඩිවීම්/අඩුවීම්)	6,438,547	7,450,116
වර්ෂය ආරම්භයේ දී ඇති මුදල් හා ඒ සමාන දෑ	21,897,378	14,447,262
වර්ෂය අවසානයේ දී ඇති මුදල් හා ඒ සමාන දෑ	**28,335,925**	**21,897,378**
වර්ෂ අවසානයේ ශේෂ පත්‍රය/ මුදල් සහ ඒ හා සමාන දෑ		
තැම්පතු මුදල්	28,315,925	21,877,378
බැංකු අයිරාව	-	-
අතැති මුදල්	20,000	20,000
	28,335,925	**21,897,378**

<u>ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

01. <u>පොදු</u>

1951 අංක 38 දරන ලෝහෝර් ආර්යා ණය අරමුදලේ (භාරකාර මණ්ඩලය) පනත (1956 සංශෝධිත) මඟින් ස්ථාපනය කරන ලද ලෝහෝර් ආර්යා ණය අරමුදල ශ්‍රී ලංකාවේ නිත්‍යවාසික අරමුදලකි. අරමුදලෙහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 02, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතෙහි අංක 100,3/2 දරණ ස්ථානයේ පිහිටා ඇත.

1.1 <u>අනුකූලතා ප්‍රකාශණය</u>

මූල්‍ය ප්‍රකාශණ පිළියෙළ කර ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලවය. (SLPSAS)

1.2 <u>මූල්‍ය ප්‍රකාශණ සඳහා වගකීම</u>

මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා භාරකාර මණ්ඩලය වගකීම දරයි.

1.3 <u>පිළියෙල කිරීමේ පදනම</u>

ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශණ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

1.4 <u>ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්</u>

සියළුම ද්‍රව්‍ය පශ්චාත් ශේෂපත්‍ර සිදුවීම් සැලකිල්ලට ගනු ලැබ ඇති අතර අවශ්‍යතන්හි මූල්‍ය ප්‍රකාශන සඳහා වූ අදාල සටහන් වල ගැලපුම් හෝ අනාවරණයන් සිදුකර ඇත.

1.5 <u>බදු</u>

<u>වර්තමාන බදු</u>
මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් වන ආදායම් බදු ගණනය ආදායම් බදු විධිවිධාන අනුකූලව ආදායම් හා වියදම් මුලද්‍රව්‍ය මත 2017 අංක 24 දරණ සංශෝධිත ආදායම් බදු පනතට අනුව සිදු කර ඇත.

1.6 <u>ආනුශංගික තොරතුරු</u>

ණය අරමුදලට අදාල වන ප්‍රතිපත්තීන් වෙනත් ආකාරයකින් විශේෂයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස, පූර්ව වර්ෂයේ යොදා ගන්නා ලද ප්‍රතිපත්තීන් හා අනුකූල වේ. ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීම පිණිස අවශ්‍ය අවස්ථාවන්හි දී පූර්ව වර්ෂයේ සංඛ්‍යා නැවත පිළියෙල කර තිබේ.

02. <u>වත්කම් සහ එහි වටිනාකම් තක්සේරු කිරීමේ පදනම.</u>

2.1 <u>බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන</u>

බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන සපයනු ලබන්නේ භාරකරුවන් විසින් සිදුකරනු ලබන සමාලෝචන පදනම් කරගෙන වන අතර පාරිභෝගිකයින් සඳහා වූ ණය වාර්තාකරනු ලබන කාල සීමාව අවසානයේදි ඉදිරියට ගෙන යන ලද හිඟ ශේෂයෙන් සපයනු ලබන ප්‍රතිපාදන අඩු කර තිබේ.

2.2 <u>ස්ථාවර තැන්පතු</u>

නුදුරු අනාගතයේ දී කෙටිකාලීන වෙළඳාමක් සඳහා ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ස්ථාවර තැන්පතු සහ අනෙකුත් පොලී තැන්පත් සුරැකුම්පත් සඳහා වියදම් වශයෙන් එකතු කරනු ලැබේ.

2.3 දේපල පිරියත සහ උපකරණ

දේපල පිරියත සහ උපකරණ මිලදි ගැනීමේ පිරිවැය සහ ඒ මත යෙදෙන යම් වියදම් ද දක්වා තිබේ.මෙම වත්කම් පහත සඳහන් කර ඇති සමුච්චිත ක්ෂය කිරීම් අඩුකර ලැබෙන පිරිවැයට දක්වා ඇත.

ගොඩනැගිලි	4%
ගෘහ භාණ්ඩ සවි කිරීම්	10%
පරිසණක උපකරණ	25%
කාර්යාල උපකරණ	10%
විදයුත් අනුසිහුම්	10%
මෝටර් රථ	25%

2008/09 වසරේ සිට ණය අරමුදල එහි ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වෙනස් කර ඇත්තේ වත්කම් මිලදී ගත් දින සිට ඒවා බැහැර කරන මාසය දක්වා ක්ෂය කිරීම පිණිසය.

2007/08 වසර සඳහා වර්ෂය තුලදි භාවිතා කරන ලද වත්කම් සඳහා ද ක්ෂය කිරීම සිදු නොකරන ලද අතර වත්කම් බැහැර කරන වසර තුළදි ද ක්ෂය කිරීම සිදු නොකරන ලදි.

2.4 අනෙකුත් ලැබිය යුතු දෑ

අනෙකුත් ලැබිය යුතු දෑ සඳහන් කර ඇත්තේ එම නිශ්කාශනය කිරීම සඳහා තක්සේරු කරන ලද ප්‍රමාණයට අනුවය.

2.5 මුදල් හා ඒ සමාන දෑ

මුදල් හා මුදල් සමාන අයිතම ඉල්ලුම් තැන්පතු සහ කෙටිකාලීන අධික ද්‍රවශීලතාවයෙන් යුතු ආයෝජන මුදල් අගයට සැලකිය යුතු වෙනසක් ඇති නොවන ආකාරයට මුදල් හුවමාරු කර ගත හැකි මූල්‍යමය වත්කම් ලෙස නිර්වචනය කර ඇත.

අරමුදල් ප්‍රවාහ ප්‍රකාශණය වක්‍ර ක්‍රමය භාවිතා කරමින් පිළියෙළ කර ඇත.

03. වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි දන්නා සියළුම වගකීම් ඉදිරිපත් කර තිබේ.

3.1 ප්‍රාග්ධන බැඳීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා අදාල සටහන් වල අරමුදලෙහි ප්‍රාග්ධන බැඳීම් අනාවරණය කර ඇත.

3.2 විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ

විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම ප්රතිලාභ සඳහා ප්‍රතිපාදන සපයා ඇත. භාරකාර මණ්ඩලය විසින් යොදා ගනු ලබන පාරිතෝෂික සමීකරණයට අනුකූලව ප්‍රතිපාදන ගණනය කර තිබේ.

3.3 නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

ව්‍යවස්ථාපිත තත්ත්වයන් හා රෙගුලාසි මත ලෝහෝර් ආර්යා ණය අරමුදල් කාර්ය මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක වී ඇත. අරමුදල විසින් 16% සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වයක් ද, 3% සේවක භාරකාර අරමුදල සඳහා දායකත්වයක් ද සෑම සාමාජිකයෙකු වෙනුවෙන්ම දරනු ලබයි.

04. ආදායම් ප්‍රකාශනය

4.1 ආදායම් හඳුනා ගැනීම

4.1.1 ණය පොලී ආදායම

ණය පොලී ආදායම උපචිත පදනම මත ගණනය කර ඇත.

රාජ්‍ය අංශයේ සේවකයන්ට ලබාදුන් ණය වලින් මාස 03 ක් සඳහා ණය ප්‍රතිපාදන නොලැබුණු ක්‍රියාකාරී නොවන ණය පිළිබඳ අරමුදල අවධානය යොමු කරන අතර ඉන් පසුව එම ණය මත ලැබෙන පොළිය මුදල් පදනම මත ගණනය කරනු ලබයි.

4.1.2 බදු කුලී ආදායම

බදු ගිවිසුම මත අරමුදල් පරිශ්‍රයේ පදිංචිව සිටින කුලී නිවැසියන්ගේ ගොඩනැගිලි කුලී ආදායම උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

4.1.3 වියදම් හඳුනාගැනීම

ණය අරමුදල අඛන්ඩව පවත්වාගෙන යාමට සහ ස්ථාවර වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාමෙහිලා ජනිත වන සියළුම වියදම් වසරේ ලාභය ගණනයේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

යම් වත්කමක පවත්නා ස්වභාවය වැඩිදියුණු කිරීමට ව්‍යාප්ත කිරීමට වත්කමක් අත්පත් කර ගැනීම වෙනුවෙන් දරනු ලබන හෝ ණය අරමුදලෙහි ඉපයීම් ධාරිතාව වැඩිදියුණු කිරීමෙහිලා ජනිත වන සියළුම වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලබයි.

		31/12/2019 රු.	31/12/2018 රු.
5	**ආදායම්**		
	රාජ්‍ය සේවකයින් සඳහා වූ ණය	**83,768,339**	**70,072,948**
	කුලී ආදායම	**16,518,177**	**16,592,790**
	ස්ථාවර තැම්පතු සඳහා පොලිය	**7,721,536**	**11,391,223**
	පොලී ආදායම - 11.5%	**393,861**	**386,221**
	නව කාර්ය මණ්ඩල ණය මත පොලී - 4.5%	**245,857**	**227,246**
	පොලී ආදායම් - 11.5%	**77,443**	**53,340**
	විශේෂ අත්තිකාරම් ණය මත පොලී	**4,110**	**2,496**
	පාපැදි ණය මත පොලිය	**1,031**	**771**
		108,730,354	**98,727,034**
6	**අනෙකුත් ආදායම්**		
	මුදල් අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද දීමනා	**2,093,228**	**2,093,228**
	විශේෂ ආදායම්	**110,320**	**931,631**
	අයැදුම්පත් අලෙවියෙන් ලැබූ ආදායම	**446,700**	**444,450**
	අනෙකුත් ආදායම්	**299,866**	**77,780**
		2,950,113	**3,547,090**
7	**සේවක මණ්ඩල පිරිවැය**		
	වැටුප්	**16,816,527**	**14,546,052**
	දීමනාව (කාර්ය මණ්ඩල දීමනාව)	**4,529,180**	**6,047,654**
	කාර්යාල සේවක අර්ථසාධක අරමුදල	**3,338,666**	**3,019,279**
	විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදන	**2,625,451**	**2,993,545**
	පාලන භාරකාරතුමාගේ දීමනාව	**1,160,221**	**1,278,417**
	වාර්ෂික ප්‍රසාද දීමනා	**680,625**	**594,422**
	සේවක භාරකාර අරමුදල	**625,381**	**556,613**
	විශේෂ දීමනාව	**404,129**	**668,339**
	භාරකාර මණ්ඩල දීමනා	**385,898**	**510,824**
	සභාපතිතුමාගේ දීමනාව	**374,356**	**324,284**
	පාලන භාරකාරතුමාගේ ඉන්ධන දීමනාව	**250,580**	**273,870**
	අතිකාල	**220,353**	**206,673**
	විගණන කමිටුව	**101,920**	**87,320**
	නිල ඇඳුම්	**32,000**	**32,000**
	හිඟ වැටුප්	**5,618**	**545**
		31,550,905	**31,139,837**

		31/12/2019	31/12/2018
		රු.	රු.
8	**පරිශ්‍රය, උපකරණ සහ ස්ථාපිත වියදම්**		
	ක්ෂය වීම	**8,200,313**	**8,308,650**
	නඩත්තු - ගොඩනැගිලි	**2,167,483**	**2,347,106**
	මුද්‍රණය හා ලිපි ද්‍රව්‍ය	**2,147,338**	**2,035,809**
	වරි පනම් සහ රජයේ ඉඩම් සඳහා බදු	**1,897,728**	**1,894,342**
	ආරක්ෂාව සහ පිරික්සුම	**1,798,841**	**1,617,047**
	විදුලිය	**1,043,803**	**1,059,625**
	නඩත්තු - පරිගණක	**538,110**	**547,365**
	ඉන්ධන සහ මෝටර් රථ ගාස්තු	**519,536**	**352,840**
	කාර්ය මණ්ඩල පුහුණු	**427,464**	**306,500**
	දුරකථන	**357,409**	**389,515**
	නඩත්තු - කාර්යාල උපකරණ	**338,227**	**208,453**
	තැපැල් හා විදුලි පණිවිඩ	**281,043**	**194,011**
	නඩත්තු - විදුලි සෝපාන	**248,639**	**554,245**
	වාහන සඳහා රක්ෂණ	**238,708**	**238,575**
	ජලය	**186,819**	**137,907**
	මුද්දර ගාස්තු	**74,950**	**69,600**
	ගොඩනැගිලි රක්ෂණ	**74,618**	**140,797**
	දැන්වීම්	**60,760**	**121,050**
	පුවත්පත් හා වාරප්‍රකාශන	**21,044**	**20,984**
	පරිත්‍යාග	**18,000**	**16,500**
	රජයේ ඉඩම් බදු	**5,000**	**5,000**
	ප්‍රවාහන	**2,400**	**3,266**
	සේවක සුබසාධනය	**-**	**245,000**
	නඩත්තු - වතුර පොම්ප	**-**	**19,000**
	පරීක්ෂා කිරීමේ ගාස්තුව	**-**	**36,915**
		20,648,233	**20,870,099**
9	**ගාස්තු සහ කොමිස් මුදල්**		
	ඍත්තීය ගාස්තු	**468,350**	**14,750**
	ජාතිය ගොඩැනැගීමේ බදු	**301,946**	**331,856**
	විගණන ගාස්තු	**75,000**	**120,997**
	බැංකු ගාස්තු	**124,626**	**117,948**
	නීති ගාස්තු	**252,768**	**18,850**
	මූල්‍ය වියදම්	**19,521**	**6,000**
	ණය අලාභ සඳහා ප්‍රතිපාදන	**151,794**	**-**
		1,394,005	**610,401**

		31/12/2019	31/12/2018
10	**බදු සඳහා වියදම්**	රු.	රු.
	ව්‍යාපාරයෙන් උපයන ලද පොලිය මත ලාභය		
	බදු පෙර ලාභය	**58,087,324**	**49,653,787**
	නිදහස් කිරීමේ ලාභය	**-**	**(12,413,4 47)**
	අනෙකුත් ආදායම්	**(26,994,124)**	**(23,821,211)**
	බදු වලින් හිලව් කිරීමට එකඟ වී ඇති වියදම්	**15,161,743**	**11,670,107**
	බදු වලින් අඩු කිරීමට හැකි වියදම්	**(670,635)**	**(1,236,557)**
	ව්‍යාපාරයෙන් උපයන ලද පොලිය මත ලාභය	**45,584,308**	**23,852,679**
	පොළිය මත ලාභය ව්‍යාපාරය සමඟ ඵලදායී ලෙස සම්බන්ධව ඇත. (වගන්ති 6(2)(උ)		
	ස්ථාවර තැම්පතු මත පොලිය	**7,721,536**	**11,391,223**
	ආයෝජන ආදායම්		
	කුලී ආදායම්	**12,452,966**	**12,351,342**
	අනෙකුත් ආදායම්		
	කාර්ය මණ්ඩල ණය මත පොලිය	**245,857**	**227,246**
	විශේෂ දීමනාවන් සඳහා වූ පොලිය	**4,110**	**2,496**
	පාපැදි ණය	**1,030**	**771**
	අයැදුම්පත් අලෙවි කිරීම	**-**	**444,450**
	විවිධ ආදායම්	**299,866**	**77,780**
	විශේෂ ආදායම්	**110,320**	**931,631**
	බදු අය කළ හැකි ආදායම	**66,419,994**	**49,279,618**
	24% ආදායම් බදු	**15,940,799**	**11,827,108**
		15,940,799	**11,827,108**

		සටහන	31/12/2019	31/12/2018
			රු.	රු.
11.	**මුදල් හා කෙටි කාලීන අරමුදල්**			
	මහජන බැංකුව - 204100 1600 85389		**26,458,932**	17,666,480
	මහජන බැංකුව - 204100 2500 85389		**471,226**	1,110,489
	මහජන බැංකුව - 204100 1800 85388		**1,385,767**	3,100,408
	අතැති මුදල්		**20,000**	20,000
			28,335,925	21,897,378
12.	**ණය සහ අත්තිකාරම්**			
	රාජ්‍ය ආයතන වල සේවකයන් සඳහා ණය	**12.1**	**445,058,258**	358,294,109
	කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්	**12.2**	**9,561,461**	7,571,786
			454,619,719	365,865,895
12.1	**රාජ්‍ය ආයතන වල සේවකයන් සඳහා ණය**			
	රාජ්‍ය සේවකයින්/ රාජ්‍ය සංස්ථා සඳහා ණය			
	ක්‍රියාකාරී ණය		**437,498,482**	350,220,846
	ක්‍රියාකාරී නොවන ණය		**8,077,402**	8,311,584
			445,575,884	358,532,430
	ක්‍රියාකාරී නොවන - ණය සඳහා විලම්බන පොලිය		**(394,829)**	(231,038)
	ක්‍රියාකාරී ණය සඳහා විලම්බන පොලිය			
	ණය අලාභ ප්‍රතිපාදන		**(122,797)**	(7,284)
			445,058,258	358,294,109
12.2	**කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්**			
	කාර්ය මණ්ඩල ණය - දස මස්		**5,561,449**	4,250,756
	කාර්ය මණ්ඩල ණය - 11.5%		**3,974,949**	2,573,532
	පාපැදි ණය		**17,063**	30,063
	උත්සව අත්තිකාරම්		**8,000**	11,750
	කාර්ය මණ්ඩල ණය -11.5%		**-**	705,685
			9,561,461	7,571,786
13.	**අනෙකුත් වත්කම්**			
	ලැබිය යුතු අත්තිකාරම්		**-**	2,645,575
	ලැබිය යුතු ගොඩනැගිලි කුලි		**1,818,761**	1,190,438
	අනෙකුත් ලැබිය යුතු දෑ		**-**	4,062
			1,818,761	3,840,074
14.	**<u>ස්ථාවර තැම්පතු මත ආයෝජන</u>**			
	ස්ථාවර තැම්පතු		**70,996,597**	108,336,612
	ස්ථාවර තැම්පතු මත පොලිය		**2,064,102**	6,287,294
			73,060,699	114,623,905

15	දේපළ පිරියත හා උපකරණ පිරිවැය	**2019.01.01** දිනට ශේෂය රු.	වසර තුල දී ගැලපීම් රු.	වසර තුල දී ඉවත් කිරීම් රු.	**2019.12.31** දිනට ශේෂය රු.
	සින්නක්කරය				
	බදු ඉඩම්	98,000,000	-	-	98,000,000
	ගොඩනැගිලි	10,400,000	-	-	10,400,000
	මෝටර් රථ	16,008,750	-	-	16,008,750
	විදුලි උපකරණ හා සිහුම්	3,379,294	304,646	(1,300)	3,682,639
	පරිගණක උපකරණ	4,696,336	517,414	(4,950)	5,208,800
	ගෘහ භාණ්ඩ හා සවි කිරීම	1,348,004	77,760	(35,422)	1,390,342
	කාර්යාල උපකරණ	1,817,676	187,843	(17,752)	1,987,767
		135,650,059	**1,087,663**	**(59,424)**	**136,678,298**

	සමුච්චිත ක්ෂය	**2019.01.01** දිනට ශේෂය රු.	වර්ෂය සඳහා ගාස්තු රු.	වසර තුල දී ඉවත් කිරීම් රු.	**2019.12.31** දිනට ශේෂය රු.
	සින්නක්කර				
	බදු ඉඩම්	16,333,333	2,333,334	-	18,666,667
	ගොඩනැගිලි	7,676,189	247,619	-	7,923,808
	මෝටර් රථ	11,928,781	4,002,188	-	15,930,969
	විදුලි උපකරණ හා සිහුම්	3,231,786	140,652	(1,300)	3,371,138
	පරිගණක උපකරණ	3,393,808	338,575	(4,950)	3,727,433
	ගෘහ භාණ්ඩ හා සවි කිරීම	707,103	102,023	(35,422)	773,704
	කාර්යාල උපකරණ	1,073,573	45,448	(17,752)	1,101,269
		44,344,574	**7,209,838**	**(59,424)**	**51,494,988**
	ලියාහල අගය	91,305,486			**85,183,310**

16	ආයෝජන දේපළ පිරිවැය/ තක්සේරුව	**2019.01.01** දිනට ශේෂය රු.	වසර තුල දී ගැලපීම් රු.	**2019.12.31** දිනට ශේෂය රු.
	ආයෝජන දේපළ	41,600,000	-	**41,600,000**
		41,600,000	-	**41,600,000**

	සමුච්චිත ක්ෂයවීම	**2019.01.01** දිනට ශේෂය රු.	වර්ෂය සඳහා ගාස්තු රු.	**2019.12.31** දිනට ශේෂය රු.
	ආයෝජන දේපළ	13,371,430	990,476	**14,361,906**
		13,371,430	990,476	**14,361,906**
	ලියාහල අගය	**28,228,570**		**27,238,094**

		සටහන	**31/12/2019**	31/12/2018
			රු.	**රු.**
17	**අනෙකුත් වගකීම්**			
	ගොඩනැගිලි කුලි තැම්පතු	17.1	**8,183,895**	8,303,895
	උපචිත වියදම්	17.2	**1,295,252**	2,019,363
	රාජ්‍ය සේවකයන් සඳහා ලබාදුන් ණය		**1,707,891**	1,201,576
	මුදල් වැඩිපුර අයකර ගැනීම් ණය හිමියන්		**373,154**	289,750
	අනෙකුත් තැම්පතු - ආරක්ෂක		**100,000**	100,000
			11,660,192	11,914,584
17.1	**ගොඩනැගිලි කුලි තැම්පත්**			
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව		**3,150,000**	3,150,000
	ලංකා විදුලිබල මණ්ඩලය		**2,400,000**	2,250,000
	ලංකා විදුලිබල මණ්ඩලය - (තොරතුරු තාක්ෂණ අංශය)		**1,402,500**	1,402,500
	සමුපකාර සේවක කොමිෂන් සභාව		**1,231,395**	1,231,395
	ඒ.ජේ.එස්.ඇසෝසියේටඩ් ආයතනය		**-**	270,000
			8,183,895	8,303,895
17.2	**ගෙවිය යුතු වියදම්**			
	නඩත්තු - ගොඩනැගිලි		**614,341**	1,265,666
	ආරක්ෂක ගාස්තු		**145,880**	147,737
	වෘත්තීය ගාස්තු		**99,513**	-
	විදුලිය		**88,624**	81,826
	විගණන ගාස්තු		**75,000**	70,000
	ගොඩැනැගිලි රක්ෂණය		**74,618**	70,399
	එකතු කළ අගය මත බදු		**51,405**	69,302
	මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය		**46,592**	218,467
	වාර්ෂික ප්‍රසාද දීමනා		**37,813**	3,750
	දුරකථන		**26,574**	29,061
	මුද්දර ගාස්තු		**17,975**	18,625
	විශේෂ දීමනා		**8,297**	2,294
	ජලය		**7,913**	8,005
	වැටුප්		**707**	-
	ජාතිය ගොඩැනැගීමේ බදු		**-**	27,680
	පාලන භාරකාරතුමාගේ දීමනා		**-**	6,551
			1,295,252	2,019,363
18	**බදුකරණය සඳහා ප්‍රතිපාදන**			
	වසර ආරම්භයේ දී ශේෂය		**5,212,534**	1,420,451
	වසර සඳහා වූ ප්‍රතිපාදන		**15,940,799**	11,827,108
	බදු ගෙවීම්		**(11,872,791)**	(6,448,294)
	රඳවා ගැනීමේ බදු		**(1,995,746)**	(1,308,087)
	පෙර වසර සඳහා ප්‍රතිපාදන		**-**	(278,644)
	වසර අවසාන ශේෂය		**7,284,797**	5,212,534
19	**මුදල් අමාත්‍යාංශයීය ලැබීම්**			
	වසර ආරම්භයේ ශේෂය		**4,186,455**	6,279,684
	වසර තුල පරිවර්තන		**(2,093,229)**	(2,093,229)
	වසර අවසාන ශේෂය		**2,093,230**	4,186,455
20	**විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන**			
	වසර ආරම්භයේ ශේෂය		**14,669,757**	12,314,465
	වසර සඳහා වූ ප්‍රතිපාදන		**2,625,451**	2,993,545
	වසර තුල දී ගෙවීම්		**-**	(638,254)
	වසර අවසාන ශේෂය		**17,295,208**	**14,669,757**